**අධ්‍යාපන අංශ සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) - පළාත් මට්ටම - 2016**

-----------------------------------------------------------------------------------------------------

අධ්‍යාපන අංශ සංවර්ධනය කිරීමේ වැඩසටහනේ (ඊඑස්ඩීපී) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

-----------------------------------------------------------------------------------------

ණය ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කරන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ සියලුම පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම් වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන අංශ මුහුණ දෙන අභියෝග භාර ගැනීමට 2013-2017 අධ්‍යාපන අංශ සංවර්ධන කාර්යය රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ද්විතීයික පාසල්වල පිරිමි හා කාන්තා උපාධිධාරී සේවා නියුක්තිය ඉහළ නංවන නවීන ද්විතීයික පාසල් අධ්‍යාපන ක්‍රමයක් වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට ප්‍රකාරව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,000කට සමාන එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කාර්යයන් 2013 අගෝස්තු 23 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 වන විට නිම කිරීමට නියමිතය. පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.3 ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------------------------------------

පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හී විසර්ජන ගිණුම්වල සංග්‍රහයක් වූ මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහනේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් පළාත් අධ්‍යාපන අංශය සඳහා ලද අරමුදල් වලින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ පළාත් අධ්‍යාපන අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේ ද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා වල 2016 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස්වල සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව, ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වන බව, ණය මුදල්වලින් දරන ලද පිරිවැය පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශවල 2016 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම්වල නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එම්ඕඑෆ්පී/ඊආර්ඞී/ 2007/2 දරන චක්‍රලේඛය අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 30 දින ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් ප්‍රකාරව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 200 | 26,000 | 4,900 | 17 | 2,399 | 137 | 18,323 |
| | **200** | **26,000** | **4,900** | **17** | **2,399** | **137** | **18,323** |

පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල මූලධන වියදම් දැරීමට පළාත් සභා සඳහා එකතුව රු. මිලියන 21,863 ක වෙන් කිරීමක් කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 වනවිට එයින් රු. මිලියන 9,661 ක මුදලක් උපයෝජනය කර තිබුණි. තවද, නැඟෙනහිර පළාත් සභාවේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා මූලධන වියදම් දැරීමට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කර තිබූ රු. මිලියන 1,582 ක වෙන් කිරීමෙන් රු. මිලියන 601.61 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට සබරගමුව සහ වයඹ පළාත්වල මූලධන වියදම් දැරීමට කර තිබූ වෙන් කිරීමෙන් පිළිවෙලින් සියයට 60ක් සහ සියයට 54ක් වියදම් නොකර පැවති බව අනාවරණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුමවල උපලේඛන 03 හි ඇමුණුම 01 අනුව, ව්‍යාපෘතිය කිරීම් සබැඳි ප්‍රතිඵල 09 ක් යටතේ ව්‍යාපෘතිය කිරීම් සබැඳි දර්ශක 33 ක් ළඟාකර ගැනීම සඳහා වැඩසටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. තවද, පළාත් සභා විසින් අධ්‍යාපන අංශය සඳහා සියලු අරමුදල් මූලාශ්‍රවලින් 2016 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම වූ රු. මිලියන 132,856 ක් නියෝජනය වන ඒකාබද්ධ වැඩසටහන්

වාර්ෂික මූල්‍ය වාර්තා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල මෙහෙයුම්වලට අදාළ 2016 වර්ෂය සඳහා පළාත් සභා විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත සඳහන් පරිදි නැවත ඉදිරිපත් කරනු ලැබේ.

(අ) විය පැහැදම් කිරීම සබැදි දර්ශක 01 අනුව, සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 63 ක් ළඟාකර ගතයුතුය. විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා අනුව, පළමුවර පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 69.94 ක් ලෙස පැවතුණි. කෙසේ වුවද, උතුරු සහ නැඟෙනහිර පළාත්වල පාසල් අයදුම්කරුවන්ගේ අපොස (සාමාන්‍ය පෙළ) සමත් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 60.66ක් සහ සියයට 61.56ක් ලෙස සාමාන්‍ය සමත් ප්‍රතිශතයට වඩා පහළ මට්ටමක පැවතුණි. තවද, අපොස (සාමාන්‍ය පෙළ) පාසල් අයදුම්කරුවන්ගේ සියළුම විෂයයන් අසමත් වීමේ ප්‍රතිශතය සියයට 3.11ක් ලෙස පැවතුණි. උතුරු මැද සහ උතුරු පළාත්වල අයදුම්කරුවන් සියලුම විෂයයන් අසමත්වීම සියයට 4.01ක සහ සියයට 4.47ක ඉහළ ප්‍රතිශතයක් වාර්තා කර තිබුණි.

(ආ) විය පැහැදම් කිරීම සබැදි දර්ශක 02 ප්‍රකාරව, පළාත් පාසල්වල විද්‍යා සහ වාණිජ විෂය ධාරාවන්ගේ ශිෂ්‍ය ජනගහනය වැඩිකිරීමට සහ කලා විෂය ධාරාව සඳහා සිසුන් ඇතුළත් වීම අඩු කිරීමට අපේක්ෂා කර තිබුණි. තවද, විය පැහැදම් කිරීම සබැදි ප්‍රතිඵල 02 අනුව, අපොස (උසස් පෙළ) විභාගයේ සමත් ප්‍රතිශතය සියයට 64 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ අදාළ සමත් ප්‍රතිශතය සියයට 62.17 ක්ව පැවතුණි. 2016 වර්ෂයේ පැවති අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල විශ්ලේෂණය මත පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කලා විෂය ධාරාවෙන් විෂයයන් 03 ම සමත් වීමේ ප්‍රතිශතය සියයට 67.07 ක් ලෙස පැවති අතර 2016 වර්ෂයේ දී පැවති අපොස (උසස් පෙළ) විභාගයේ විෂයයන් 03 ම සමත් වීමේ සමස්ත ප්‍රතිශතය ඉහළ නැංවීමට එය විශාල ලෙස බලපා තිබුණි.

(ii) විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාවට අනුව, අපොස (උසස් පෙළ) විභාගයට අසුන්ගත් පාසල් අයදුම්කරුවන් 211,865ක් අතුරින් උතුරු මැද පළාතේ පාසල් අයදුම්කරුවන් සියයට 10.51 ක් ඇතුළුව සියයට 8.36 ක් නියෝජනය කරනු ලබන පාසල් අයදුම්කරුවන් 17,702 ක් සියළු විෂය ධාරාවන්ගෙන් සියළු විෂයයන් අසමත් වී තිබූ අතර සියයට 3.05 ක් නියෝජනය කරනු ලබන ශිෂ්‍යයන් 6,468 ක් සියළු විෂයන්ට විශිෂ්ඨ සාමාර්ථ ලබාගෙන තිබුණි.

(iii) තවද, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ සියයට 69.64 ක ඉහල ප්‍රතිශතයක් වාණිජ අංශයේ පාසල් අයදුම්කරුවන් වාර්තා කළ අතර භෞතික විද්‍යා අංශයෙන් පාසල් අයදුම්කරුවන් සියයට 53.26 ක් සහ ජීව විද්‍යා අංශයෙන් පාසල් අයදුම්කරුවන් සියයට 53.35 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණි.

(iv) අළුතින් හඳුන්වා දුන් ඉංජිනේරු තාක්ෂණය සහ ජීව විද්‍යා විෂය ධාරාවලින් අධ්‍යයන කටයුතු කළ පාසල් අයදුම්කරුවන් පිළිවෙලින් සියයට 55.58ක සහ සියයට 60.16 ක සමත් ප්‍රතිශතයක් වාර්තා කර තිබුණි. කෙසේ වුවද, ඉංජිනේරු තාක්ෂණය විෂය ධාරාව සහ ජීව විද්‍යා තාක්ෂණය විෂය ධාරාවෙන් පාසල් අයදුම්කරුවන් 10 දෙනෙකු පමණක් විෂයයන් 03 සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබාගෙන තිබූ අතර අදාළ විෂය ධාරාවන්ගෙන් පාසල් අයදුම්කරුවන් 1,384 ක් සියළුම විෂයන් අසමත් වී තිබුණි.

(ඇ) විය පැහැදම් කිරීම සැබැඳ දර්ශක 08 අනුව, පුහුණු ගුරුවරුන් සහ අවශ්‍ය උපකරණ සහිතව පාසල් 100 ක තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. සියළුම පළාත්වල පාසල් 251 ක තාක්ෂණික විෂය ධාරාව සඳහා පන්ති ආරම්භ කර තිබුණද බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, හෝමාගම, හොරණ, කළුතර, පිළියන්දල, ශ්‍රී ජයවර්ධනපුර, උතුරු පළාතේ කිළිනොච්චි, උතුරු මැද පළාතේ අනුරාධපුර, දිඹුලාගල, ගලෙන්බිඳුනුවැව, හිඟුරක්ගොඩ, කැකිරාව, පොළොන්නරුව, තඹුත්තේගම, සහ ඌව පළාතේ බණ්ඩාරවෙල, බිබිල, මොණරාගල, පස්සර සහ වැල්ලවාය අධ්‍යාපන

කලාප වල පාසල් 25 කට කිසිදු ගුරුවරයෙකු අනුයුක්ත කර නොතිබුණි. තවද, ගම්පොල, ගලේවෙල සහ මීගහකිවුල අධ්‍යාපන කලාපවල පාසල් 03 කට ගුරුවරුන් 14 ක් අනුයුක්ත කර තිබුණද තාක්ෂණ විෂය ධාරාවේ පන්ති සඳහා කිසිදු ශිෂ්‍යයෙකු නොමැති බව නිරීක්ෂණය විය. පළාත් පාසල් වල තාක්ෂණ විෂය ධාරාව සඳහා පන්ති පවත්වාගෙන යාමට ගුරුවරුන් වෙන් කිරීම සාධාරණ ක්‍රමයට සිදු නොකරන බව එයින් දක්වනු ලැබේ.

(ඈ) දිවයින පුරා පළාත් පාසල් 255 ක් අපොස (උසස් පෙළ) සඳහා විද්‍යා විෂය ධාරාව සහිත පාසල් ලෙස වර්ගීකරණය කළද, අපොස(උසස් පෙළ) පන්ති සඳහා ගුරුවරුන් ප්‍රමාණවත් පරිදි අනුයුක්ත කර නොමැති බව විස්තරාත්මක විමර්ශනයේ දී අනාවරණය විය.එමනිසා, පළාත් පාසල් 255 අතුරින් රසායන විද්‍යාව විෂයයන් සඳහා පාසල් 57 ක, භෞතික විද්‍යාවට පාසල් 63 ක, ජීව විද්‍යාවට පාසල් 59ක, කෘෂි විද්‍යාවට පාසල් 95 ක සහ සංයුක්ත ගණිතයට පාසල් 72 කට 2016 දෙසැම්බර් 31 වනවිටත් ගුරුවරුන් අනුයුක්ත කර නොතිබුණි.

(ඉ) සිදුකරන ලද විගණන පරීක්ෂාවන්ට අනුව, වයඹ පළාතේ තාක්ෂණික විද්‍යාගාර 126 ක් ස්ථාපිත කර තිබූ අතර අදාළ විෂයයන් සඳහා ගුරුවරුන් 47 දෙනෙකුගේ හිඟය, ඉගෙනුම් උපකරණ සහ විදුලිය සහ විද්‍යුත් උපකරණ ආදී අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීම වැනි හේතු කිහිපයක් නිසා එයින් පාසල් 36ක පමණක් අපොස (උසස් පෙළ) විද්‍යා සහ ගණිත පන්ති ආරම්භ කර තිබුණි. වයඹ පළාතේ පාසල් 08 ක සිසුන් 05 කට වඩා අඩුවෙන් සමන්විත වූ විද්‍යා සහ ගණිත පන්ති තිබූ අතර එම විෂය ධාරාවන් සඳහා සිසුන්ගේ ඇතුළත් වීම පහළ මට්ටමක පවතින බවට එය සාක්ෂි සපයයි.

(ඊ) විය පැහැදම් කිරීම් සබැඳි දර්ශක 08 අනුව, රේඛීය අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ අතර වූ කාර්ය සාධනය මත පදනම් වූ හවුල්කාරී ගිවිසුම් පළාත් සහ මධ්‍යම මට්ටමේ වැඩ සැලසුම් එක් කිරීමට විමර්ශනය කළයුතු අතර 2016 දී මූලිකව අනුමත කරන ලද මූලධන අයවැයෙන් අවම වශයෙන් සියයට 85 ක් පාසල් අධ්‍යාපනය සඳහා උපයෝජනය කර ඇති බව තහවුරු කර ගතයුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා 09 හි මුළු මූලධන වෙන්කිරීම රු.මිලියන 21,863.22 ක් වූ අතර එයින් මූලධන වියදම් සඳහා වූ මූලික වෙන්කිරීමෙන් සියයට 44 ක් නියෝජනය කරන රු.මිලියන 9,661.31 ක මූලධන වියදමක් 2016 දෙසැම්බර් 31 වන විටත් උපයෝජනය කර නොතිබුණි. උතුරු මැද සහ දකුණු පළාත්වල මූලික වෙන්කිරීමෙන් පිළිවෙලින් සියයට 26.93 ක් සහ සියයට 34.43 ක් නියෝජනය කරන මූලධන වෙන් කිරීම් උපයෝජනය කිරීමේ පහළ ප්‍රතිශතයක් වාර්තා කර තිබුණි.

(උ) 2016 පාසල් සංගණනයට අනුව, දිවයින පුරා ඇති පාසල් 10,162ක් අතුරින් පාසල් 7,832ක සිසුන් 500කට වඩා අඩු පාසල් වේ. තවද, සිදු කරන ලද විස්තරාත්මක විගණනය අනුව, ඌව සහ නැගෙනහිර පළාත් හැර පළාත් පාසල් 644ක් 2016 දෙසැම්බර් 31 වනවිට වසා දමා තිබුණි. දකුණු පළාතේ පළාත් පාසල් 165ක්, බස්නාහිර පළාතේ පළාත් පාසල් 146ක් සහ වයඹ පළාතේ පළාත් පාසල් 113ක් 2016 දෙසැම්බර් 31 වනවිට වසා දමා තිබූ බව තවදුරටත් වාර්තා විය. කෙසේ වුවද, පාසල් වසා දැමීමට හේතු විමර්ශනය කිරීමට සහ රටේ අඩු වරප්‍රසාද බුක්ති විඳින ශිෂ්‍ය කණ්ඩායම් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම සඳහා එම පාසල් නැවත විවෘත කිරීමට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සමඟ එක්ව රේඛීය අමාත්‍යාංශය විසින් ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.